4 වන පිටෙන්

## මහින්ද ඉල්ලන් කෑවා

මාස ගණනක් තිස්සේ පැවති මහින්ද අගමැති කිරීමේ කන්කරච්චලය හමාරය. ලක්ෂ පනස් අටේ කයිවාරුව හමාරය. මේ වන විට තවත් වැඩිවෙලා යයි විමල් වීරවංශලා කෑමොර දුන් ලක්ෂ පනස් අට හය මාසයක් ගත වන විට ලක්ෂ හතලිස් අටෙන් පහළට බැස්සේය. මහින්දට ජනාධිපතිවරණයේදී ලැබුණු ඡන්ද ප්‍රමාණය සැබෑ ජනමතය නොවන බව අපි දිගින් දිගටම කීවෙමු. දැන් එය මනාව ඔප්පු වී තිබේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරණයෙන් පරාජය වුණේ ජාත්‍යන්තර කුමන්ත්‍රණයකින් යයි කී කතා යළිත් කියන්නට ඉඩක් දැන් නැත. තමා පරාජය කළේ උතුරු නැගෙනහිර දෙමළ මුස්ලිම් ඡන්දවලින් යයි කෙරුණු ප්‍රකාශය බොරු කරමින් මෙවර දකුණේ ජනතාවගේ තීන්දුව මෙන්න යයි පෙන්වා දී තිබේ.

පාලකයකු සම්බන්ධයෙන් ජනතාව තම අකමැත්ත ප්‍රකාශ කළ විට ඒ පාලකයාට යම් තරමකට හෝ බුද්ධියක් ඇත්නම් ඔහු කරන්නේ තම පාලන කාලය තුළ උපයා ගත් යම් කීර්තියක් වෙතොත් එය ආරක්ෂා කර ගනිමින් නිහතමානීව ඉවත්ව යාමය. එහෙත් තමා පිළිබඳ අධි තක්සේරුවක් ඇති, බලයෙන් මත්වූ පාලකයා එසේ පරාජය පිළිගන්නේ නැත. එවිට ඔහු පිළිබඳව දෙවෙනි වරටත් තම තීන්දුව ප්‍රකාශ කරන්නට ජනතාවට සිදුවෙයි. මහින්ද රාජපක්ෂ ජනතාවගෙන් දෙවන වර තීන්දුව ද ඉල්ලා සිටියේය. ජනතාව දැන් දෙවන වරටත් තීන්දුව දී තිබේ. මහින්ද දෙවරම කළේ ඉල්ලාගෙන කෑමය. තවත් වසර දෙකක් ජනාධිපති ලෙස ඉන්නට ඉඩ තිබියදී තමා පිළිබඳ අධි තක්සේරුවක් තිබුණු මේ නායකයා කළේ තමාම තීන්දු කර ජනාධිපති වරණය දෙවසරකට කලින් කැඳවීමයි. ඒ ඉල්ලා ගෙන කෑමෙන් පාඩම් ඉගෙන නොගත් ඔහු මහ මැතිවරණය හරහා අගමැති වෙන්නට පාරම් බාමින් ඒ සඳහා සියලු උප්පරවැට්ටි යෙදුවේය. මේ රටේ බහුතර ජනයා තමා සිතුවාට වඩා බුද්ධිමත් බව ඔහු දැන් වත් තේරුම් ගත යුතුය.

ජනාධිපතිවරණයෙන් පසුව ගතවූ මාස හය ගෙවුණේ සුළුතර ආණ්ඩුව සහ බහුතර විරුද්ධ පක්ෂය අතර කඹ ඇදිල්ල වෙනුවෙනි. හරිහැටි කියන්නේ නම් ඒ මුළු මාස හයම මහින්දවාදී මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුව යොදා ගත්තේ රනිල්ගේ ආණ්ඩුවට වැඩ කරන්නට නොදී සියල්ල කඩාකප්පල් කරන්නටත් රාජපක්ෂ පවුල් පාලනය කාලේ සිදුකළ මහා පරිමාණ වංචා දූෂණ නාස්ති සහ රාජ්‍ය බලය අයුතු ලෙස යොදාගැනීමට විරුද්ධව ආරම්භ කෙරුණු පරීක්ෂණ අඩපන කිරීමටත්ය. මහත් වැර යොදා 19වන සංශෝධනය පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නට හැකි වූ නමුත් එය සම්මත වුණේ හොඳටම කප්පාදු කිරීමෙන් පසුවයි. දැන් මහජනයා පාර්ලිමේන්තුවේ රනිල්ට තිබුණු ඒ සුළුතරය බහුතරය බවට පත්කරදී තිබේ. මෛත්‍රීගේ උපාය උපක්‍රම මගින් හදගත් ජාතික ආණ්ඩුව ඇමති මණ්ඩලයක් ද පත් කරගෙන තිබේ. දැන් වැඩ කළ යුතු කාලය එළඹ තිබේ. ප්‍රශ්නය වන්නේ වැඩ කළ හැකිවේද? යන්නය.

## පන්සල සහ දේශපාලනය

මහින්ද ජනාධිපතිවරණයෙන් පරාජය වූ ද සිට දවසට පන්සල් දෙක තුන ගානේ වන්දනාවේ ගියේය. පන්සල්වල නායක ස්වාමීන් වහන්සේලා තරගයට මෙන් ඔහු පන්සල්වලට වඩම්මවා ගත්හ. දැන් ඒ වන්දනාව අවසන්ය. ඒ වැඩැම්මීමද අවසන්ය. දේශපාලනඥයන් සහ පන්සල අතර ඇති අවස්ථාවාදී සම්බන්ධය කෙසේද යන්න හොඳින් ප්‍රදර්ශනය වී තිබේ. හරි නම් මහින්ද රාජපක්ෂ වෙනුවෙන් වඩ වඩා බෝධිපූජා පැවැත්විය යුත්තේ දැන්ය. දෙවරක් පරාජය වූයේ ඔහුට මහා අපලයක් ඇති නිසා නොවේද? ඔහු පසුගිය දවස්වල ප්‍රදර්ශනය කළ ඒ බෞද්ධකම අහිංසක බෞද්ධ උපාසකම්මලා රැවටීමේ උපායක් බව දැන් නොපෙනේද? ඔහුට අගමැති වෙන්නට නොහැකි වුවද ඒ උපායෙන් සරු ප්‍රතිඵල නෙලා ගත් බව ගම්බද ප්‍රදේශවල ඡන්ද වැටී ඇති ආකාරය දෙස බලන විට පෙනේ.

එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය පාවිච්චි කළ ඡන්දදායකයන් වැඩිම මනාපය ප්‍රකාශ කර ඇත්තේ පසුගිය කාලයේ මේ රටේ පාර්ලිමේන්තුව ගවර වළක් බවට පත් කරගෙන මජර දේශපාලන සංස්කෘතියක් ගොඩනැගූ අයට බව පෙනේ. දූෂිතයන්, අපරාධකරුවන් ලෙස නම් ලබා ඇතියවුන් තම නියෝජිතයන් බවට පත් කර ගන්නට කැමති පිරිසක් තවමත් මේ රටේ සිටින බව එයින් පෙනේ. මෙය යහපත් අනාගතයක් වෙත රට ගෙන යන්නට දරණ උත්සාහයට බරපතල බාධාවකි. දූෂිතයන් අපරාධකරුවන් අනුමත කරන කොටසකින් සමන්විත සමාජයක් ඉදිරියට යන්නේ නැත.

රාජපක්ෂ පවුල් පාලනය මේ රට ගෙන ගොස් ඇත්තේ පහසුවෙන් ගොඩ ගත හැකි අගාධදයකට නොවේ. එහෙයින් මහින්දගේ විනාශකාරී දශකය සම්මුතිවාදී දේශපාලනයට යට කර අමතක කර දැමිය නොහැකිය. එසේ වුවහොත් එය රටට කරන මහාම ද්‍රෝහිකම වන්නේය. ඒ යුගයේ සියලු දූෂණ, වංචා නාස්ති, අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂණ කිසිම හේතුවක් නිසා බාල කළ යුතු නැත. යහපත් දේශපාලන සදාචාරයක් අනාගතයේ ගොඩනැගෙන්නට නම් වැරදිකරුවන් සියල්ලන්ටම තරාතිරම නොබලා, පක්ෂ සම්බන්ධකම් නොබලා දඬුවම් දීම අත්‍යවශ්‍යය.

එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තේරීපත්වී ඇති මන්ත්‍රීවරුන්ගෙන් කී දෙනෙකු නම් ජනාධිපතිවරයා අපේක්ෂා කරන කාර්යයන් සඳහා සුදුසුකම් ඇති අයද කියන එක බරපතල ප්‍රශ්නයකි. කෙසේ වුවද මෙවරද පිරිසිඳුම ආණ්ඩුවක් අපේක්ෂා කරන්නට තරම් අප අඳබාල විය යුතු නැත. රනිල් වික්‍රමසිංහ මහතා දූෂිතයකු නොවන බව රට දන්නා නමුත් එක්සත් ජාතික පක්ෂය සම්පූර්ණයෙන් පිරිසිඳු කිරීම ද පහසු කටයුත්තක් නොවනු ඇත. ඒ කරුණු කාරනා නිසා හොඳම ආණ්ඩුවක් වෙනුවට වැරදි අඩු ආණ්ඩුවක් බාර ගන්නට ජනතාව සූදනම් විය යුතු වෙයි.

**එක්සත් ජනතා නිදහස් සන්ධානයට ඡන්දය පාවිච්චි කළ ඡන්දදායකයන් වැඩිම මනාපය ප්‍රකාශ කර ඇත්තේ පසුගිය කාලයේ මේ රටේ පාර්ලිමේන්තුව ගවර වළක් බවට පත් කරගෙන මජර දේශපාලන සංස්කෘතියක් ගොඩනැගූ අයට බව පෙනේ. දූෂිතයන්, අපරාධකරුවන් ලෙස නම් ලබා ඇතියවුන් තම නියෝජිතයන් බවට පත් කර ගන්නට කැමති පිරිසක් තවමත් මේ රටේ සිටින බව එයින් පෙනේ.**

සන්නස Cartoon by PK






# I am going home tomorrow, I want to see him

Sherin Fernando
Lynbrook

After months of cold and wetness, September brings bright and colour adding warm thoughts of another season of spring. Preparations will go underway once more when families make arrangements to celebrate another day dedicated to our fathers. The word father is described as the male parent who functions in a paternal capacity and who brings up his children. He is also the founder of a line of descend. Father's Day is celebrated in honor of our dear dads to show appreciation for their love and support.

The day brings a reminder of not only the fathers who live but the ones who are gone forever from this world. As a child, I never knew who my grand-fathers were, had no chance to see them or enjoy their affection and being in their presence. They were long gone before my birth. Children love listening to stories of the past and I remember the times my parents talked of their era with their fathers. Those stories never for ones restricted their thoughts to a day; they were above and beyond with abundance of love and respect for their fathers who had gone from this life years ago.

Reminiscence of childhood always nestled on my father as the hero in the family. He was the big tree that spread its branches to shelter us from the rays of the rough sun. Nourished and cared for by his love and immersed in his wealth of knowledge, we grew. Observing him as he supported my mother in the journey of life with three children I learned to look at life and enjoy what it brings. Calm and quiet nature constantly taught us that we could conquer the world if we have the heart to do it. My father inspired me to be who I am and what I have achieved and my life will forever be a dedication to him. Married, I flew away from his nest to build my own. Weary journeys and struggled paths to-date reminds me that he is there as always had been.

How would you know a father's love if you never had one? This is the heart-aching reality today. Broken families, separated lives impact on the upbringing of the children and the man or the woman they ultimately grow into. Deprived of a father's love as a boy, there is no inspiration for him to be a father that his children would long for, look up to and love. Could a mother give her child the love of a father? She could be the best mother ever but never the father. Among Sri Lankan songs I appreciate those written for mums in their honour, immersed in love. But not so much when it comes to a father's love. I saw no difference in that love while growing up as a child, embracing the world as a young adult; or entering into the parenthood. A father's love strengthens the family bond tightening the unity.

Galloping across my memory road I am now travelling back many years to an incident that happened while I was a resident student in the University of Peradeniya. Lost sometimes, in the labyrinth of Ramanathan Hall, one of the residence Halls for girls at the time with numerous floors and wings, we shared most precious moments of a university student life. I remember it was quite late in the night, possibly very close to midnight, but we were up studying in our own rooms. The walls of the Hall echoed suddenly with a girl's lament. It sounded utterly painful, overwhelmingly tragic and unbearable. We ran out of our rooms, through the corridors and down the stairwells to get close to the room of the crying girl. Hovering over the balconies we waited, heavy hearted. "Her father is dead", someone said. I couldn't hold my tears and the girls looked at each other as if to notice if anyone could. Miles away from home, moments to midnight, hearing her father's death, the girl is devastated. All I could think of was my father. "I am going home tomorrow, I want to see him."

We live and thrive in our parents' love. We treasure the moments that may never come again. Your dad is your super-power. The world he creates for you is the world you conquer. Embrace his love and slowly pay it back each day not holding it for fathers' day. The day comes and goes, but the warmth his presence gives you, the comfort you sense around him and the memory of how you are his pride and joy linger on for days, months and many more years to come!